# ජනාධිපති කාර්යාලය
# சனாதிபதி அலுவலகம்
# PRESIDENTIAL SECRETARIAT

EWIS PE...
16
15 NOV 2025
RECEIVED

මගේ අංකය : PS/FIN/FD/Ast/07/06

දිනය : 2025 නොවැම්බර් මස 12 වන දින

කළමනාකරු
Ewis Peripherals (PVT) Ltd
ගාලු පාර
කොළඹ 03

**ජනාධිපති කාර්යාලය ප්‍රධාන ගබඩාවේ පවතින භාවිතා කර අවසන් වූ ටෝනර් ඉවත් කිරීම**

මේ වනවිට අප කාර්යාලයේ භාවිතා කර අවසන් වූ හිස් ටෝනර් 600ක් පමණ ප්‍රධාන ගබඩාව තුල එක්රැස්ව පවතී. මෙම හිස් ටෝනර් ප්‍රමාණය පරිසර හිතකාමී සහ විධිමත් ක්‍රමවේදයක් හරහා අපහරණය කර ගැනීම සිදුකරගත යුතුව ඇත.

02. මේ වන විට පරිසර අධිකාරියේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ බලයලත් ආයතනයක් ලෙස ඔබ ආයතනය ලියාපදිංචි වී ඇති බැවින්, මෙම කාර්යය සඳහා ඔබ ආයතනයේ සේවය ලබා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් විමසීමට තීරණය කර ඇත.

03. එබැවින්, මෙම හිස් ටෝනර් ප්‍රමාණය ඔබ ආයතනයට ගැනීමට හැකියාවක් ඇත්ද යන්න හා එම ටෝනර් සඳහා ඔබ විසින් යම් මුදල් ගෙවීමක් සිදු කරන්නේ නම් ඒ පිළිබඳ තොරතුරු 2025/11/25 දිනට පෙර මා වෙත පහත ලිපිනයට හෝ psassetmgt@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ලිපිනය : ප්‍රධාන මූල්‍ය නිලධාරී
ජනාධිපති ලේකම් කාර්යාලය
ගාලු මුවදොර
කොළඹ 01

මේ සම්බන්ධයෙන් ඔබ විසින් දක්වන සහයෝගය ඉතා අගයකොට සලකමි.

අත් කලේ/ ආචාර්ය එන්.එස්.කුමානායක
ජනාධිපති ලේකම්

එන්.එම්.ආනන්ද අමරදේව
ප්‍රධාන මූල්‍ය නිලධාරී

දුරකථන : +9411-2320880
ෆැක්ස් : +9411-2329392
විද්‍යුත් තැපැල : cfo@presidentsoffice.lk